*සැ. යු.* - 2011.06.17 දින පළ වූ අංක 1711 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,712 - 2011 ජුනි මස 24 වැනි සිකුරාදා - 2011.06.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 980 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.*- (i) මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ ශාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 ජුනි මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ශ්‍රී ලංකා මනෝවිද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 ජුනි මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජූලි මස 01 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජුනි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් පාලන නිවේදන

## රඹුක්කන ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය

කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය සභාව 2011.04.26 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී සම්මත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මංමාවතකට අදාල ඉඩම් හිමියන් විසින් සභාව වෙත ලබාදෙන ලද ලිඛිත කැමැත්ත අනුව, එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ කිනම් කරුණක් නිසාද යන්න සඳහන් කළ ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 30ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපළක් හැටියට සලකා එකිනෙකා ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ඒ. එන්. බී. හඳගම,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

මාර්ග විස්තරය

| | | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|
| *ග්‍රාම නිලධාරී වසම :* | 2සී දඹුල්ල | 475 | 08 |

*මාර්ගයේ නම :* දඹුල්ල මුත්තෙට්ටුව වෙලමැද මාර්ගය

*වම්පස :* එච්. රංජනී යන අයට හා එච්. සෝමරත්න යන අයට අයත් යද්දෙහිකොටුව ඉඩමෙන් ද, ඩී. රූපරත්න, ඩී. ගුණපාල සේනාධීර, ඩී. සයිමන් හා ඩී. කරුණාරත්න යන අයවලුන්ට අයත් කණුගැටිය යන කුඹුරුවලින් මායිම් වන්නා වූ ද,

*දකුණුපස :-* එම්. තෝමස් යන අයට අයත් හිටිනාවත්ත ද, එච්. එන්. සරත්චන්ද්‍ර හා එම්. තෝමස් යන අයවලුන්ට අයත් පින්වත්ත ද, ඩී. සුසන්ත උදයසිරි හා ඩී. සෝමතිලක යන අයට අයත් ගොඩැල්ලේ වත්ත යන ඉඩම්වලින් මායිම් වන්නා වූ මුත්තෙට්ටුව කමත දක්වා පාර

06-419/1

---

## රඹුක්කන ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය

කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය සභාව 2011.04.07 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී සම්මත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මංමාවතකට අදාළ ඉඩම් හිමියන් විසින් සභාව වෙත ලබාදෙන ලද ලිඛිත කැමැත්ත අනුව, එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ කිනම් කරුණක් නිසාද යන්න සඳහන් කළ ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවන දින සිට දින 30ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපළක් හැටියට සලකා එකිනෙකා ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ඒ. එන්. බී. හඳගම,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

*මාර්ග විස්තරය*

| | | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|
| *ග්‍රාම නිලධාරී වසම :* | කුඩාගම උතුර | 305 | 08 |

*මාර්ගයේ නම :* පන්සල්වත්ත සිට අමුහේන හරහා කොහොලානාගොඩ පාර

*වම්පස :* එස්. අසෝක කරුණාරත්න යන අයට අයත් අමුහේනවත්ත, ආර්. එම්. පියවතී යන අයට අයත් අමුහේන වත්ත, එච්. නිමල් ජයසූරිය යන අයට අයත් කොහොලානා වත්ත ඉඩමෙන් මායිම් වන්නාවූ ද,

*දකුණු පස :* තිලක් උදේනි සුමනසිරි හා එච්. ජේ. ගුණතිලක යන අයවලුන්ට අයත් අමුහේන ඉඩමෙන් ද, එන්. ඩී. ඒ. ක්‍රිස්ටෝපර් යන අයට අයත් කොහොලානාගොඩ වත්ත දක්වා පාර.

06-419/2

---

## රඹුක්කන ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය

කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය සභාව 2011.04.26 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී සම්මත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මංමාවතකට අදාල ඉඩම් හිමියන් විසින් සභාව වෙත ලබාදෙන ලද ලිඛිත කැමැත්ත අනුව, එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ කිනම් කරුණක් නිසාද යන්න සඳහන් කළ ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 30ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපළක් හැටියට සලකා එකිනෙකා ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ඒ. එන්. බී. හඳගම,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

*මාර්ග විස්තරය*

| | | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|
| යටිවල්දෙනිය | පර්. 03 දම්. 09 (අඩි 2586) | 12 | 08 |

*ග්‍රාම නිලධාරී වසම :*

*මාර්ගයේ නම :* යටිවල්දෙනිය වෙල්යාය මැදින් ඇති සමගි මාවත

*වම්පස :* සියඹලා කුඹුරින් ආරම්භව එච්. ආර්. ටිකිරි බණ්ඩා යන අයට අයත් සියඹලා කුඹුර ද, පී. ආර්. ජයසේන, එච්. ආර්. සේනානායක බංඩා

හා එච් . ආර්. ජයවික්‍රම යන අයවලුන්ට අයත් කපුරු කුඹුරින් ද, එච්. ආර්. පොඩිමැණිකේට අයත් මානෙල් ලියද්ද කුඹුර ද, වී. ජී. නිමල් රත්නපාල යන අයට අයත් දෙහිගස්තැන්න කුඹුර ද, එච්. පී. ජී. මාලා ජයරත්න යන අයට අයත් බුවැලිකඩ අස්වැද්දුම කුඹුර ද, ඩබ්ලිව්. කරුණාරත්න, එස්. යූ. තිලකරත්න, එස්. එම්. යූ. පී, සමරතුංග, ජේ. ඒ. පොඩි නිලමේ, පී. ආර්. ඩිංගිරි අම්මා, එස්. එන්. තිලකරත්න, එස්. එම්. උපතිස්ස කරුණාරත්න, පී. ජී. ගුනරත්න බණ්ඩා හා එල්. ඩී. ආරියවතී යන අයවලුන්ට අයත් දෙහිගස්තැන්න යන කුඹුරුවලින් මායිම් වන්නා වූ ද

දකුණුපස : ඩබ්ලිව්. කමල් ගුණරත්න, සුගත් දිසානායක, පී. ආර්. ජයසේන, ඩබ්ලිව්. ඩී. එල්. ගුණරත්න, එච්. ආර්. චන්ද්‍රරත්න, හා ඩබ්ලිව්. කරුණාරත්න යන අයවලුන්ට අයත් කපුරු කුඹුරින් මායිම් වන්නාවූ වෙදරාලගේ වත්ත දක්වා වූ පාර

06-419/3

---

***සම්මත අතුරු ව්‍යවස්ථාවක් පිළිගනු ලැබූ බව ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනය***

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

**නාරම්මල ප්‍රාදේශීය සභාව - නාරම්මල**

261 වැනි අධිකාරයවන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව නාරම්මල ප්‍රාදේශීය සභාව විසින් 2011.04.07 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

2011 ජුනි මස 07 වැනි දින,
නාරම්මල දී ය.

උපලේඛනය : සම්මත අතුරු ව්‍යවස්ථාවක් පිළිගැනීම සඳහා පළාත් පාලන ආයතනයක් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාවේ ආදර්ශය -

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික පනතේ 02 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ *(අ)* ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස් පළ කරනු ලැබූ වයඹ පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරන ලද 2011.04.28 අංක 1703/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ ද ප්‍රාදේශීය සභාවල අප්‍රසන්න, අන්තරායදායක සහ අප්‍රසන්න හා අන්තරායදායක වෙළෙඳාම් කටයුතු සංචාරක වෙළෙඳාම ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම, ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම, ප්‍රාදේශීය සභා සීමාව තුල පාරවල් සහ මංමාවත් සැරසිලි කිරීම, ලැඟුම් නිවාස හා නවාතැන්පලවල් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ නාරම්මල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

මෙම යෝජනාව ඒකමතිකව සම්මත වූ අතර, *ගැසට් නිවේදනයේ* පළ වන දින සිට නාරම්මල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක වේ.

06-568

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.